# ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

# 7 ශ්‍රේණිය

## සංශෝධිත විෂය නිර්දේශය
## 2022

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.lk

## හැඳින්වීම

2022 වර්ෂයේ පළමු වාරය සඳහා මෙතෙක් පැවැත් වූ දින 21 තුළ සම්පූර්ණ කර ඇති කාල පරිච්ඡේද 12ක් ලෙස සලකා ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂය ට පළමු වාරයේ දී කාල පරිච්ඡේද 24ක් ද දෙවන වාරය හා තුන්වන වාරය සඳහා කාල පරිච්ඡේද 18 බැගින් 36ක් ද වන පරිදි සමස්ත කාල පරිච්ඡේද සංඛ්‍යාව 60කි.

මෙම විෂයෙහි ලා වැදගත් වන කරුණු උපරිම වශයෙන් සාක්ෂාත් කර ගත යුතු නමුත් මේ සඳහා ලබා දීමට හැකි කාලය සීමා වී තිබේ. මේ සමග ඔබ වෙත ලබා දී ඇති සංශෝධිත විෂය නිර්දේශය සකස් කර ඇත්තේ නව අධ්‍යයන වාරය සඳහා පාසලට පැමිණෙන සිසුන් සඳහා වූ එම අඩුපාඩුව ඔබගේ සහයෝගයෙන් මගහරවා ගැනීමේ බලාපොරොත්තුව ඇතිව ය. සම්පූර්ණ කළ යුතු අනිවාර්ය විෂය කොටස් තෝරා ගෙන, ඒවායේ අන්තර්ගතය අවස්ථානුකූලව යම් තරමකට කෙටි කර, කාල පරිච්ඡේද 60 තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදීමට හැකිවන පරිදි සංශෝධිත විෂය නිර්දේශය සැලසුම් කර ඇත . පහත මග පෙන්වීමට අනුව, එම විෂය කොටස් සඳහා වෙන් කර ඇති කාලච්ඡේද තුළ දී ආවරණය කර දරුවන් වෙනුවෙන් ඔබේ යුතුකම  ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා විෂය ප්‍රතිසංවිධානයේ දී විෂය අරමුණු උපරිමයෙන් සාර්ථක කර ගැනීම සඳහා අවධානයට යොමු කළ යුතු කරුණු**

- ගුරුවරයාගේ විධිමත් පෙර සූදානම පන්ති කාමරය තුළ වැය වන අනවශ්‍ය කාලය ඉතිරි කර ගැනීමට දායක වනු ඇත. අමතර කාලය අවශ්‍ය වන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ගැනීමට අන් ගුරුවරුන්ගේ සහයෝගයෙන් ඔවුන් සමග කාලය හුවමාරු කර ගැනීමට ක්‍රියා කරන්න.
- සැමවිටම ප්‍රායෝගික කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සහ පොදු කුසලතා සංවර්ධනයට ප්‍රධාන තැනක් ලබා දිය යුතු ය.
- වෙන් කර ඇති කාලය ප්‍රමාණවත් නොවන අවස්ථාවල දී පැවරුම් මඟින් එම කොටස් ආවරණය කරන්න. පැවරුම් සඳහා නිශ්චිත කාලයක් සඳහන් නොවන නමුත් ඉදිරි පියවර හා බැඳුනු ඉගෙනුම් ඵල සාක්ෂාත් කර ගැනීම සඳහා පැවරුම් ඉටු කර තිබීම වැදගත් වන අතර එම පැවරුම් සිසුන් විසින් නිම කළ බවට සටහන් තබා ගන්න. **පාසල නොපැවැත් වෙන දින දෙක පැවරුම් සම්පූර්ණ කිරීම සඳහා යොදා ගැනීමට ද යෝජනා කෙරේ.**

අපගේ ප්‍රධාන අරමුණ වන්නේ සිසුන් වැඩ ලෝකයට ගැළපෙන ආකාරයට පොදු සහ මෘදු කුසලතාවලින් පරිපූර්ණ තාක්ෂණයට සුහුරුකම් දක්වන පුද්ගලයන් බවට පත් කිරීමට  ප්‍රා. තා. කු. විෂය තුළින් අප මෙතෙක් දැරූ සාර්ථක උත්සාහය පවතින දුෂ්කර වාතාවරණය යටතේ ද බාධා රහිත ව ඉදිරියට ගෙන යාමයි. මේ සඳහා ගුරු සිසු දෙමාපිය සහ වැඩිහිටියන්ගේ සහයෝගය දැඩි ව අපේක්ෂා කෙරේ.

**සටහන - 1.3, 2.2 හා 3.1 නිපුණතා මට්ටම්  2022 වර්ෂයේ පාසල් පැවති කාල සීමාව තුළ දී සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම නිපුණතා මට්ටම් සංශෝධිත විෂය නිර්දේශයෙන් ඉවත් කිරීමක් සිදු නොකළ ද ඒ සඳහා නැවත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කාලච්ඡේද වෙන් කරනු නොලැබේ. එහෙත් එම කොටස් ඉදිරි ඇගයීම් කටයුතුවල දී ඇගයීමට භාජනය කිරීමට සුදුසු බවට නිර්දේශ කෙරේ.**

# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

(07 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද  24  ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18 ක් ද බැගින් කාලච්ඡේද 60 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

## 07 ශ්‍රේණිය - පළමු වාරය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 07 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 1.0 පවතින සම්පත් යොදා ගනිමින් වගා භූමිය සංවර්ධනය කරයි. | 1.3 කුඩා ගෙවත්තක් පවත්වා ගෙන යයි. | • ගෙවත්තට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නිවැරදි ව සකස් කරයි.<br>• ගෙවත්ත පවත්වා ගෙන යාමට අවශ්‍ය පැළ ලබා ගැනීම සඳහා තවාන් නඩත්තු කරයි.<br>• සුදුසු මෘදුකාංගයක් භාවිත කොට ගෙවතු වගාවට අදාළ ව වගා පත්‍රිකාවක් පවත්වා ගෙන යයි. | • රෝපණ ද්‍රව්‍ය සකස් කිරීම<br>  ◦ මේරූ ඉදුණු එළවළු එල මගින් බීජ නිස්සාරණය, වියළීම හා ගබඩා කිරීම<br>  ◦ බීජ පැළ<br>  ◦ දඬු, වර්ධක අල කැබලි<br>• තවාන් බඳුන් හා තවාන් මාධ්‍ය<br>• සරල පැළ ප්‍රචාරණ ඒකක<br>• තවාන් පවත්වා ගැනීම<br>• සුදුසු මෘදුකාංගයක් භාවිතයෙන් බීජ සිට වූ දින සිට වගා | පිටු අංක 18- 21 | 01 පුංචි ගෙවත්තක පැළ නිපදවමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | පිළිවෙත් සිදු කරන දින ඇතුළත් වගා පත්‍රිකාවක් සැලසුම් කර පවත්වා ගැනීම | | | |
| 2.0 ජෛව පරිසරය සුරැකීමට දායක වෙයි. | 2.2 පාසල් වත්ත දර්ශනීය වන පරිදි භූමිය අලංකරණය කරයි. | • පාසල් වත්තේ පිහිටීමට අදාළ ව දළ සැලැස්මක් නිර්මාණය කරයි.<br>• භූමි අලංකරණයේ දී භාවිත කෙරෙන ශාක හා ඒවායේ කාර්යයන් අධ්‍යයනය කරමින් ස්ථානයට උචිත ශාක තීරණය කරයි.<br>• පරිසරයට දර්ශනීය පෙනුමක් ලබා දීමේ දී තවදුරටත් එකතු කළ යුතු ඉදිකිරීම් හා ව්‍යූහ තෝරා ගනියි. | • පාසල අයත් භූමියේ පිහිටීම හා දළ සැලැස්ම<br>• භූමියේ ඒ ඒ ස්ථාන සඳහා තෝරා ගන්නා විවිධ ශාකවල කාර්යයන්<br>• ශාක පිහිටුවීමේ විවිධ හැඩ නිර්මාණ<br>• ශාක ඇසුරෙන් වර්ණ සංයෝජනය හා විචිත්‍රත්වය<br>• භූමි අලංකරණය වඩා තීව්‍ර කරන සරල ඉදි කිරීම් හා ව්‍යූහ<br>  • බිම් ඇතුරුම් ගල්<br>  • කුඩා මාවත්<br>  • වැටවල්, ආරුක්කු<br>  • ගිරි උයන් | පිටු අංක 22-23 | 02<br>පාසල් වත්ත දර්ශනීය වන පරිදි භූමි අලංකරණය කරම | 4 |
| 3.0 ගොවිපොළ සතුන් ඇති | 3.1 ගෙවත්තක ඇති කළහැකි | • ගෙවතු පරිසරයට හිතකර සුලබ ව ඇති කළ හැකි සතුන් කාණ්ඩගත කරයි. | • ගෙවතු පරිසරයට හිතකර, සුලබ ව ඇති කරන සත්ත්ව කාණ්ඩ | පිටු අංක 24-25 | 03<br>ගෙවත්තේ සතුන් ඇති කරමු - ආහාර සපයමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| කිරීමේ ක්‍රම විමසා බලයි. | සතුන්ට අවශ්‍ය ආහාර සපයයි. | • සතුන්ගේ විවිධ අවශ්‍යතා අනුව සැපයිය යුතු ආහාර තීරණය කරයි. | • ප්‍රදේශයෙන් සපයා ගත හැකි සරල ආහාර | | | |
| 4.0 ආහාරවල ගුණාංග සුරැකෙන අයුරින් පරිභෝජනය සඳහා ආහාර සුරක්ෂිත කිරීමට දායක වෙයි. | 4.4 පරිභෝජනය සඳහා සෞඛ්‍යාරක්ෂිතව ආහාර සුදානම් කරයි. | • සටහන - මුළුතැන්ගෙය ආශ්‍රිත ක්‍රියාකාරකම් අතරතුරදීම සනීපාරක්ෂාව හා ආරක්ෂක පූර්වොපා පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරන්න.<br>• පරිභෝජනය සඳහා ආහාර සෞඛ්‍යාරක්ෂිත ලෙස සැකසීමට අනුගමනය කළ යුතු පිළිවෙත් විස්තර කරයි.<br>• අමුද්‍රව්‍ය විවිධ හැඩවලට කොටස් කරයි.<br>• වර්ණ විපර්යාස වැළැක්වීම සඳහා පෙර ප්‍රතිකර්ම යොදා ආහාර සැකසීමට සූදානම් කරයි. | • ආහාර සකස් කර ගැනීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය සුදානම් කිරීම<br>  • අපද්‍රව්‍ය ඉවත් කිරීම<br>  • පිරිසිදු ජලයෙන් සේදීම<br>  • පොතු ඉවත් කිරීම<br>  • හැඩ ගැන්වීම<br>• එළවළු පලතුරු වර්ණ විපර්යාස වැළැක්වීම<br>  • පෙර ප්‍රතිකාර යෙදීම | පිටු අංක 26-28 | 04<br>ආහාර පිසීමට අමුද්‍රව්‍ය සූදානම් කරමු | 4 |
| 4.0 ආහාරවල ගුණාංග සුරැකෙන අයුරින් පරිභෝජනය සඳහා ආහාර | 4.5 මුළුතැන්ගෙයි ආම්පන්න හා උපකරණ භාවිත කරමින් | • ආහාර සැකසීම සඳහා ගන්නා අමුද්‍රව්‍ය විවිධ ස්වභාවයනට පත් කළ හැකි ආකාර ලැයිස්තුගත කරයි.<br>• මුළුතැන්ගෙයි ආම්පන්න හා උපකරණ භාවිත කරමින් අමුද්‍රව්‍ය විවිධ ස්වභාව බවට පත් කරයි.<br>• අමුද්‍රව්‍ය විවිධ ස්වභාව බවට පත් කර වෙනස් රස හා | • මුළුතැන්ගෙයි ආම්පන්න හා උපකරණ භාවිත කරමින් අමුද්‍රව්‍යවල ස්වභාව වෙනස් කිරීමේ ආකාර<br>• කැබලි කිරීම<br>**(Size reduction)** | පිටු අංක 29 - 31 | 05<br>ආහාර අමුද්‍රව්‍යවල ස්වභාවය වෙනස් කරමු - හැඩ කරමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| සුරක්ෂිත කිරීමට දායක වෙයි. | පරිභෝජනය සඳහා ආහාර සකසයි. | වයනයෙන් යුතු ආහාර සකසයි. | • තලප බවට පත් (Puree)<br>• යුෂ බවට පත් (Juicing)<br>• කෙටීම (Grinding)<br>• පිටි කිරීම (Powdering)<br>• උකු ද්‍රාවණ පිළියෙල (Slurring)<br>• මිශ්‍ර කිරීම (Mixing)<br>• පදම් කිරීම (Seasoni<br>• හැඩ ගැන්වීම (Shaping/ Forming | | | |
| 4.0 ආහාරවල ගුණාංග සුරැකෙන අයුරින් පරිභෝජනය සඳහා ආහාර සුරක්ෂිත කිරීමට දායක වෙයි. | 4.6 පිසීමේ ආම්පන්න හා උපකරණ භාවිතයෙන් ආහාර පිසීම සිදුකර, සිත් ගන්නා ලෙස පිළිගන්වයි. | • ආහාර පිසීමේ විවිධ ක්‍රම හා භාවිත කරන පිසීමේ ආම්පන්න හා උපකරණ ලැයිස්තුගත කරයි.<br>• පිසීමේ ක්‍රමවල වාසි අවාසි තුලනාත්මකව සලකා ආහාර පිසීමට උචිත ක්‍රම භාවිත කරයි.<br>• පිසින ලද ආහාර අලංකාර ලෙස පිළිගැන්වීම සඳහා නිර්මාණාත්මක ක්‍රම යොදයි. | • පිසීමේ ආම්පන්න හා උපකරණ භාවිත කරමින් ආහාර පිසීම<br>• බ්ලාන්ච් කිරීම (Blanching)<br>• තැම්බීම (Boiling)<br>• හුමාලයෙන් තැම්බීම (Steaming)<br>• තෙලේ බැදීම (Frying)<br>• පෝරණුවේ පිළිස්සීම (Baking)<br>•රෝස්ට් කිරීම (Roasting/Grilling) | පිටු අංක 32-34 | 06<br>ආහාර පිසිමු - සිත් ගන්නා ලෙස පිළිගන්වමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | • කර කිරීම (Toasting)<br>• පිසින ලද ආහාර අලංකාර ලෙස පිළිගැන්වීම<br>• වර්ණ<br>• හැඩතල | | | |
| | | | | | සමස්ත එකතුව | 24 |
| | | | | | පළමු වාරය සඳහා ඉතිරි කාලච්ඡේද ගණන | 24-12<br>= 12 |

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

### 7 ශ්‍රේණිය - දෙවන වාරය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **07 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 6.0 තාක්ෂණික කාර්යයන් සපුරා ගැනීම සඳහා මූලික අත් ආවුද උපකරණ හා ද්‍රව්‍ය ආරක්ෂිත ව හා මනා ව යොදා ගනියි. | 6.3 නිමැවුමක ආකර්ෂණීය බව වර්ධනය ට සරල විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග යොදා ගනියි. | • ආකර්ෂණීය බව වර්ධනයට උචිත සරල පරිපථයක් තෝරා ගනියි.<br>• විදුලිය පාලනය සඳහා යොදන උපාංග විස්තර කරයි.<br>• උචිත උපාංග භාවිත කර විදුලියෙන් වෙනත් ශක්ති උපදවා ගනියි.<br>• පරිගණක මෘදුකාංග ඇසුරෙන් පරිපථ සමරූපණය කර ක්‍රියාකාරිත්වය තහවුරු කර ගනියි. | • ආකර්ෂණීය බව වර්ධනයට සරල විදුලි/ඉලෙක්ට්‍රොනික පරිපථ<br>• විදුලි ධාරා සැපයුම - වියළිකෝෂ<br>  • වෝල්ටීයතාව, ධාරාව<br>• පාලන උපක්‍රම<br>  • ධාරාව - ප්‍රතිරෝධක<br>  • ධාරා මාර්ගය හැරවීම - ස්විච්ච<br>  • විදුලිය ගබඩා කිරීම - ධාරිත්‍රක<br>  • ධාරාව එක් දිශාවකට යැවීම - **LED** | පිටු අංක 35- 41 | 07<br>සරල ඉලෙක්ට්‍රෝනික උපාංග භාවිත කරමු | 6 |
| | 6.4 තාවකාලික අවශ්‍යතා සඳහා | • ජල නළ දිගුවක් සඳහා අවශ්‍ය උපාංග ඇතුළත් සැලසුමක් අඳියි.<br>• ජල නළ දිගුව සඳහා වියදම ඇස්තමේන්තු කරයි. | • තාවකාලික ජල කරාම ස්ථාපනය<br>  • ජල නළ උපාංග<br>    ▪ සම්බන්ධ කිරීම් - කෙවෙනි | පිටු අංක 42 - 47 | 08<br>නල සකසමු ජලය සුරකිමු<br>09<br>හදමු හැඩ කරමු | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | ජල නළ දිගුවක් ස්ථාපනය කරයි. | • ගැළපෙන ක්‍රමවේද භාවිත කොට, ජල නළ දිගුවක් ස්ථාපනය කරයි.<br>• නිර්මාණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, අත් ආවුද හා උපකරණ තෝරා ගනියි.<br>• විවිධ ශිල්පීය ක්‍රම භාවිතයෙන් නිර්මාණ කරයි. | ▪ හැරවීම් - වැලමිට නැම්ම (Elbow)<br>• පාලක - කරාම, කපාට<br>• ඉදිකිරීම් ද්‍රව්‍ය<br>• ගඩොල්, දැව, බැඳුම් ද්‍රව්‍ය<br>• සුබෝපයෝගී විද්‍යාව(Ergonomics)<br>• ස්ථාපිත උස<br>• ජල කාන්දු වැලැක්වීම<br>• ද්‍රව්‍ය,අත් ආවුද හා උපකරණ තෝරා ගැනීම<br>• ශිල්පීය ක්‍රම භාවිතයෙන් අවශ්‍යතාව අනුව<br>• කොටස් එක් කිරීම<br>• කොටස් ඉවත් කිරීම<br>• ඇලවීම<br>• පින්තාරු කිරීම | | | |
| 8.0 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ දී උචිත තීරණ ගනියි. | 8.2 වෙළෙඳ පොළ විමර්ශනය කරමින් තාර්කික පාරිභෝගිකයකු | • වෙළෙඳපොළක ලක්ෂණ සොයා පෙළ ගසයි.<br>• භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී පාරිභෝගිකයාගේ තීරණය කෙරෙහි බලපාන සාධක විමසා බලයි.<br>• භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේදී බුද්ධිමත් ව තීරණ ගැනීමේ කුසලතා වර්ධනය කර ගනියි. | • වෙළෙඳපොළ<br>• පාරිභෝගික අවශ්‍යතා<br>• ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන්<br>• සමජාතීය භාණ්ඩ හා සේවා.<br>• පිරිවිතර<br>• ප්‍රමිති<br>• මිල | පිටු අංක 48 - 49 | 10<br>වෙළෙඳපොළ විමර්ශනය කරමු - තාර්කික පාරිභෝගිකයෝ වෙමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | වීමේ පදනම ගොඩන ගා ගනියි. | | • ක්‍රය ශක්තිය<br>• රුචිකත්වය<br>• වෙළෙඳපොළ විෂමාචාර<br>• මිල වෙනස් කිරීම්<br>• ප්‍රමාණය වෙනස් කිරීම්<br>• කල් ඉකුත් වූ භාණ්ඩ<br>• වෙනත් | | | |
| | 9.3 විවිධ ව්‍යාපාර සංවිධාන විමසා බලයි. | • ව්‍යාපාර සංවිධානය වී ඇති ආකාරය අනුව වර්ග කරයි.<br>• විවිධ ව්‍යාපාර පිහිටුවා ක්‍රියාත්මක කරයි.<br>• විවිධ ව්‍යාපාරවල වාසිදායක හා අවාසිදායක තත්ත්වයන් අත්දකියි. | • විවිධ ව්‍යාපාර සංවිධාන<br>• තනි පුද්ගල ව්‍යාපාර<br>• හවුල් ව්‍යාපාර<br>• සමාගම් (කුඩා) | පිටු අංක 50 - 51 | 11<br><br>විවිධ ව්‍යාපාර සංවිධාන හඳුනා ගනිමු | 2 |
| | | | | | දෙවන වාරය සඳහා සමස්ත එකතුව | 18 |

2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

7 ශ්‍රේණිය - තෙවන වාරය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 07 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| | 9.4 නිෂ්පාදන ක්‍රියාවලියක පියවර අධ්‍යයනය කරයි. | • නිෂ්පාදනයේ යෙදවුම්, ක්‍රියාවලිය හා නිමැවුම සැලසුම් කරයි.<br>• නිෂ්පාදන ක්‍රියාවලිය ගැලීම් සටහනකින් දක්වයි. ද්‍රව්‍ය හා ශ්‍රම වියදම් පදනම් කර ගනිමින් නිෂ්පාදන වියදම ගණනය කර වාර්තා කරයි. | • නිෂ්පාදනය සැලසුම් කිරීම<br>• නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර<br>• නිමැවුමක ද්‍රව්‍ය හා ශ්‍රම වියදම් වාර්තාකරණය<br>• ඉදිරිපත් කිරීම | පිටු අංක 52 - 53 | 12 නිපැයුම් ක්‍රියාවලිය සැලසුම් කරමු - පිරිවැය වාසි ලබමු | 6 |
| 10.0 නිර්මාණයක විචිත්‍රත්වය ඔප් නැංවීමට සරල රටා යොදා ගනියි. | 10.3 භූමි අලංකරණය සඳහා හැඩතල යොදා ගනියි. | • ආකර්ෂණීය බව වර්ධනයට උචිත සරල පරිපථයක් තෝරා ගනියි.<br>• විදුලිය පාලනය සඳහා යොදන උපාංග විස්තර කරයි.<br>• උචිත උපාංග භාවිත කර විදුලියෙන් වෙනත් ශක්ති උපදවා ගනියි.<br>• පරිගණක මෘදුකාංග ඇසුරෙන් පරිපථ සමරූපණය කර ක්‍රියාකාරිත්වය තහවුරු කර ගනියි. | • තෝරා ගත් භූමියේ ඇතුළත් ජ්‍යාමිතික හ හැඩතල ආශ්‍රිත නිර්මාණ<br>  • තලරූප ආශ්‍රිත නිර්මාණ<br>  • ත්‍රිකෝණාකාර, චතුරස්‍රාකාර, පංචාස්‍රාකාර, ෂඩස්‍රාකාර, වෘත්තාකාර, ඉලිප්සාකාර, අණ්ඩාකාර<br>• නිර්මාණයේ දළ රූප සටහන | පිටු අංක 54 - 55 | 13 භූමි අලංකරණය සඳහා හැඩතල යොදා ගනිමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | • ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් සැලැස්ම ඇඳීම<br>• | | | |
| | 10.4 රූප මාධ්‍ය සන්නිවේදනයේ ආකර්ෂණීය බව වර්ධනයට රටා යොදා ගනියි. | • සන්නිවේදනය සඳහා රූප මාධ්‍ය යොදා ගනියි.<br>• රූප මාධ්‍ය සන්නිවේදනයේ ආකර්ෂණීය බව වර්ධනය සඳහා අක්ෂර, රූප හා රටා යොදා ගනියි.<br>• විස්තරාත්මක තොරතුරු කැටිකොට දැක්වීමට අක්ෂර, රූප හා රටා භාවිත කරයි. | • අක්ෂර, රූප හා රටා ඇතුළත් නිර්මාණ<br>  • දැන්වීම් ලිපි<br>  • අත් පත්‍රිකා<br>  • පුවත් ලිපි | පිටු අංක 56 - 57 | 14 රූප මාධ්‍ය සන්නිවේදනයේ ආකර්ෂණීය බව වර්ධනයට රටා යොදා ගනිමු | 4 |
| 11.0 රූපීය පෙනුම් ඇඳීමේ දී හා ආකෘති තැනීමේ දී ඒවා අතර සබඳතාව යොදා ගනියි. | 11.2 රූපීය පෙනුම් උපයෝගී කර ගනිමින් ආකෘති තනයි. | • පෙනුම පදනම් කර ගනිමින් දළ පෙනුම් අඳියි.<br>• රූපීය පෙනුම් ඇඳීමේ දී සමානුපාතික බව පවත්වා ගනියි.<br>• රූපීය පෙනුම ඇඳීම සඳහා මෘදුකාංග යොදා ගනියි. | • රූපීය පෙනුම<br>  • ඉදිරි පෙනුම<br>  • පැති පෙනුම<br>  • සැලැස්ම<br>• මිනුම්<br>  • සමානුපාතික බව<br>• පරිගණක ආශ්‍රිත සරල භාණ්ඩ නිර්මාණ නිරූපණය සඳහා සුදුසු මෘදුකාංග භාවිතය (උදා- FreeCAD) | පිටු අංක 58 - 62 | 15 රූපීය පෙනුම උපයෝගී කර ගනිමින් ආකෘති තනමු | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය / පිටු අංක | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | තෙවන වාරය සඳහා සමස්ත එකතුව | 18 |